සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත,

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය 2022.05.25 දින රුහුණ විශ්වවිද්‍යාලයේ පරිපාලනයට එරෙහිව විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙයට හේතුව 2018 වසරේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයෙහි නවක වදය සිද්ධීන්ට හසුව මාස හයකට ආසන්න කාලයක් රිමාන්ඩ් භාරයේ සිටි සිසුන් 18 දෙනාට දඬුවම් කිරීමට විරුද්ධව බව මාගේ හැඟීමයි. මෙය ජාතික වශයෙන් ඉස්මතු වූ ප්‍රශ්නයක් වන අතර මෙම සිද්ධිය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය පිළිබඳව මුළු රටම රුහුණ විශ්වවිද්‍යාලය ඉමහත් ප්‍රශංසාවට ලක්කරන ලදී. නවක වදයෙහි ප්‍රතිඵලයක් ලෙස මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයෙහි ඉගෙනුම ලබන දර්ශ උදයංග නමැති සිසුවා රුහුණ විශ්වවිද්‍යාලයේදී තමන්ට සිදු වූ දරුණු අමානුෂික නවක වදය පිළිබඳව පොලිසියට පැමිණිලි කළේය. මේ සම්බන්ධයෙන් පියවර ගත් පොලිසිය මීට අදාළ සැකකාර ශිෂ්‍යයන් අත්තඩංගුවට ගැනීමෙන් පසු, අධිකරණය විත්තිකරුවන් රිමාන්ඩ් භාරයට පත් කළේය. විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රචණ්ඩත්වය සහ නවක වදය වැළැක්වීම පිළිබඳ 1998 අංක 20 දරන පනතේ මේ සඳහා නීතිමය පදනමක් ද ඇත.

ඉහත සිද්ධිය සම්බන්ධයෙන් දර්ශ උදයංග ශිෂ්‍යයා පොලීසියට කල පැමිණිල්ල සම්බන්ධව විශ්වවිද්‍යාල පරිපාලනය කිසිදු සම්බන්ධයක් නොමැත. පසුව මෙම සිසුවා මේ සම්බන්ධයෙන් රුහුණ විශ්වවිද්‍යාලය වෙතද පැමිණිලි කළ අතර රුහුණ විශ්වවිද්‍යාලය විසින් අභ්‍යන්තර විනය පරීක්ෂණ පවත්වා අධිකරණ ක්‍රියාමාර්ගවලින් අනතුරුව සිසුන්ගේ පන්ති තහනම් කරන ලදී. ඒ සම්බන්ධව මූලික හා විධිමත් පරීක්ෂණ දැන් අවසන් වී ඇත. 2022.05.19 දින පැවති සභා රැස්වීමේ දී මෙහි සියලු තොරතුරු සභාගත කරන ලද අතර ඇතැම් තීරණ ද ගනු ලැබිණි. වත්මන් විරෝධය රුහුණ විශ්වවිද්‍යාලයට එල්ල වී ඇත්තේ රුහුණ විශ්වවිද්‍යාලයේ කවුන්සිලයේ දී ගනු ලැබූ නීතිමය තීරණ ක්‍රියාත්මක කිරීමට එරෙහිව ය. එබැවින් මෙම විරෝධතාව සදාචාරාත්මක වශයෙන් යුක්ති සහගත නොවන අතර  නරකම දෙය නම් සියලුම විරෝධතා සිවිල් සමාජයට සහ සමාජ සාධාරණත්වයට එරෙහි විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ නීති කඩ කරන්නන් සඳහා නිසි නීතිමය / විනය ක්‍රියාමාර්ග ගැනීම වැළැක්වීම සඳහා වීමයි.

වත්මන් විරෝධතාවය සංවිධානය කරනු ලබන්නේ කිසිදු විශ්වවිද්‍යාලයක, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයක ලියාපදිංචි ශිෂ්‍ය සංගමයක් නොවන අ.වි.ශි.බ.ම. විසිනි. එබැවින් එය නීති විරෝධී සංවිධානයකි. එය පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්ද 8200ක් (දුමින්ද නාගමුව මහතා අපේක්ෂකයා විය) සහ 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී මුළු රටේම ඡන්ද 42000ක් ලබාගත් පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ශිෂ්‍ය හස්තයද වේ. මෙම සීමිත ආධාර පදනමත් සමඟ අ.වි.ශි.බ.ම.ය සහ පෙ.ස.ප.ට අවශ්‍ය වී ඇත්තේ මේ රටේ සෑම දෙයක් ගැනම

ජාතික ප්‍රතිපත්තිය තීරණය කිරීමටත් විශ්වවිද්‍යාල සිසුන් තම දේශපාලන ක්‍රීඩාවේ අතකොළු ලෙස යොදා ගැනීමටය.


මෙම සංවිධාන අවශ්‍ය වී ඇත්තේ රුහුණ විශ්වවිද්‍යාලය ආක්‍රමණය කිරීමට සහ මෙහි දේපළවලට හානි කිරීමටය. නමුත් මාහට අවශ්‍ය වන්නේ මෙම සිදුවීම වලක්වාලීම සහ මෙම විරෝධතාවයේදී වටිනා අධ්‍යාපන අවස්ථා අහිමිකරමින් රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන් නීතිමය ගැටලුවලට සහ විනය ක්‍රියාමාර්ගවලට එළඹීම වැළැක්වීමටයි. රුහුණ විශ්වවිද්‍යාලයේ CCTV කැමරා පද්ධතිය ඉතා මැනවින් ස්ථාපිත කොට ඇති අතර ප්‍රචණ්ඩත්වයේ සියලු අපරාධකරුවන් අවසානයේ අල්ලා ගනු ඇත. හැසිරීම සාමූහික වුවද, නීති පද්ධතිය තුළ කටයුතු කිරීමේදී ඉතා වගකීමෙන් කටයුතු කිරීමට පුද්ගලබද්ධ වගකීමක් ශිෂ්‍යයන් වන ඔබ සියලුදෙනාට ඇත.

රුහුණ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයක්ද පිහිටුවීමටද නියමිතය නමුත්, තවම පීඨ දෙකක් පීඨ ශිෂ්‍ය සංගම් තෝරා නොගත් නිසා එය ප්‍රමාද වී ඇත. රුහුණ විශ්වවිද්‍යාලයේ හි මහා ශිශ්‍ය සංගමය (ම.ශි.ස) යනුවෙන් කිසිවක් නැත. එබැවින් මෙම මහා ශිෂ්‍ය සංගමයෙහි සභාපති ලෙස තමාව හඳුන්වා ගන්නා ප්‍රසන්න මධුසංක බණ්ඩාර මහතා රුහුණ විශ්වවිද්‍යාලයහි සැබෑ සිසුන් නොමඟ යවයි. විශ්වවිද්‍යාලය තුල ඔහුව පන්ති තහනමකට ලක්කර ඇති බැවින් ඔහු තවදුරටත් රුහුණ විශ්වවිද්‍යාලයහි ශිෂ්‍යයෙකු නොවේ. ඔහු අහිංසක ශිෂ්‍යයන් සහභාගි කරගෙන අසත්‍ය ප්‍රචාර පතුරවමින් සංවිධානය කරුනු ලබන සියල්ල පදනම් විරහිත බව බුද්ධිමත් ශිෂ්‍යයන් වන ඔබ තේරුම්ගත යුතුය. මේ සිසුන් ජාතික දේශපාලනයේ යෙදෙමින් තම දේශපාලන පැවැත්ම සකසා ගැනීම උදෙසා විශ්වවිද්‍යාලයේ අනෙකුත් සිසුන් වන ඔබව සම්බන්ධ කරගන්නේ සියලු සත්‍ය තොරතුරු හා මොවුන්ගේ උපක්‍රමශීලී අරමුණු සඟවමිනි.

මෙම විරෝධතා සියල්ලෙහි අවසාන ඉලක්ක වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමින් සහ විශ්ව විද්‍යාල මට්ටමින් අධ්‍යාපන පද්ධතිය කඩාකප්පල් කිරීමයි. යුද්ධයේ උච්චතම අවස්ථාව වන විටත් එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් තෝරාගත් තරුණයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම හැර උතුරු නැගෙනහිර ප්‍රදේශවල දරුවන්ගේ සහ තරුණයින්ගේ අධ්‍යාපනය කඩාකප්පල් නොකළ බව කරුණාවෙන් සලකන්න. ඇත්ත වශයෙන්ම 30 වසරක යුද්ධයේදී ජාතික විභාග පැවැත්වීම සහ පාසල් පවත්වාගෙන යාම සඳහා එල්.ටී.ටී.ඊ.ය සහාය විය. එල්ටීටීඊය මෙන් නොව, අ.වි.ශි.බ.ම. 1987 සිට 1989 දක්වා සහ ඉන් පසුව බලය යොදා ගනිමින් සෑම විරෝධතාවකදීම අධ්‍යාපනය කඩාකප්පල් කළේය.

එබැවින් ඔබ අද භුක්ති විඳින ජීවිතයේ නිදහස ගැන හොඳින් සිතා බලන ලෙසත් කිසි විටෙකත් එම නිදහස වෙනත් කෙනෙකුගේ දේශපාලන ක්‍රීඩාවකට කැප නොකරන ලෙසත් සියලුම රුහුණ

විශ්වවිද්‍යාලයේ සිසුන්ගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි. වසර හතළිහක කාලයක් පුරාවට රුහුණ විශ්වවිද්‍යාල ඉතිහාසයේ නවක වදය සහ ප්‍රචණ්ඩත්වය දුටු මා  රුහුණ විශ්වවිද්‍යාලයහි සමස්ත ප්‍රජාවගේ සහයෝගය ඇතිව මාගේ නායකත්වය යටතේ එම ප්‍රචණ්ඩකාරී පරිසරය අවසන් කොට සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම නිදහසේ තම අධ්‍යාපනික කටයුතු පවත්වා ගැනීමට හැකි පරිසරයක් රුහුණ විශ්වවිද්‍යාලය තුල ගොඩනගන ලදී. අද ඔබ එය අත්හැරියොත් කිසිවකුටත් ඒ නිදහස ඔබට නැවත ලබා දීමට නොහැකි වනු ඇත.



Professor Sujeewa Amarasena
(MBBS,MD,DCH(Col),DCH(Sydney)
Vice-Chancelleor
University of Ruhuna
Matara
Sri Lanka

24.05.2022

මහාචාර්ය සුජීව අමරසේන

උප කුලපති

රුහුණ විශ්වවිද්‍යාලය.